සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2011 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,824 - 2013 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2013.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 222 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/25952.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/එල් 3/11/4.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 334, නොච්චියාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නොච්චියාගම ගමේ ප්‍රමාණයෙන් පර්. 11.05ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා ප්‍රසන්න සම්පත් සෝමපාල විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | රවීන්ද්‍ර කුමාරගේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ඒ. කරුණාදාසගේ ඉඩම ; |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | : | මාලනී රාජකරුණාගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

*දඩ මුදල* .- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2012.12.20 සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන් හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

*(එ)* නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනි,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2013 ජූලි මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-469

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/35328.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :එන්පීපී/පීඑල්සී/2007/4/18/4
(4) රඹෑව.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 112, කාටුපුලියන්කුලම ග්‍රාම නිලධාරී වසමේ, සියඹලෑව ගමේ පිහිටි පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරී විසින් සකස් කරන ලද අනුරේඛනයේ කැබලි අංක 01 දරන රජයේ බිම් කැබැල්ල ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 10.2 ක් වාණිජ කටයුතු සඳහා ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ නන්දසේන බණ්ඩාර මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | සියඹලෑව වැව් බැම්ම රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | අතුරු පාර රක්ෂිතය ; |
| *දකුණට* | : | රඹෑව අනුරාධපුර ප්‍රධාන මාර්ග රක්ෂිතය ; |
| *බටහිරට* | : | ඩබ්. ඒ. සුමිත් චන්ද්‍රලාල් ගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (1995.06.15 සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු

මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

දඩ මුදල.- ඉඩමේ දියුණු වටිනාකමින් 4% මුදල මෙන් තුන් ගුණයකි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2013.02.19 සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2013 ජූලි මස 15 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-468

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/35792.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
පළාත්/ඉකො/ඉ2/මහව/දීබ4/7.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 222, දැහැනක්ගම ග්‍රාම නිලධාරි වසමේ, දැහැනක්ගම ගමේ 2010/36 දරන අනුරේඛනයේ කැබලි අංක ඒ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0425ක් සී/ස දැහැනක්ගම සණස සමිතිය වෙත, සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

*උතුරට* : ආර්. එම්. මුතුමැණිකා හිමිකම් කියන ඉඩම හා ප්‍රාදේශීය සභා මාර්ගය ;
*නැගෙනහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය ;
*දකුණට* : ප්‍රාදේශීය සභා මාර්ගය හා රජය හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : රජය හිමිකම් කියන ඉඩම හා ආර්. එම්. මුතුමැණිකා හිමිකම් කියන ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2012.10.19 දින සිට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2012 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඉ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඊ) අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

(උ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ප්‍රසාදි උබයසිරි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2013 ජූලි මස 18 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
"මිහිකත මැඳුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ලහි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-475

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/36669.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
යූපීඑල්සී/එල්/4/කේජී/එල්/62.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 146/බී දෙටගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කතරගම නව නගරය ගමේ අංක එම්ඕ/කේටීආර්/2012/49[සී] අනුරේඛනයේ කැබලි අංක ඒ බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0306ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා පතිරණයේ දොන් උපාලි ජයවර්ධන විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක $1^N$ , 1729 සහ 494 හි කොටස් ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 494 සහ 1729 හි කොටස් ; |
| *දකුණට* | : | කැබලි අංක 1729 හි කොටසක් ; |
| *බටහිරට* | : | කැබලි අංක 1729 සහ $1^N$ හි කොටස්. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය .-* අවුරුදු තිහයි (30), (2013.07.25 දින සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2013 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*වාර මුදල.-* වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2013.07.25 සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2013 ජූලි මස 26 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-551

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/36381.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/Les/Tri/Man/361.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක මාංගායුත්තු 243කේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ආන්දන්කුලම් ගමේ අංක Tri/TWG/2007/228 පිඹුරේ කැබලි අංක ඒ වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8654 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා සීමාසහිත සණස සංවර්ධන බැංකුව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර (කැබලි අංක 107 තුළ පී. පී. ත්‍රී. 30) ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 296 තුළ පී. පී. ත්‍රී. 30 ; |
| *දකුණට* | : | කැබලි අංක 296 තුළ පී. පී. ත්‍රී. 30 සහ පාර (කැබලි අංක 64 තුළ පී. පී. ත්‍රී. 30); |
| *බටහිරට* | : | කැබලි අංක 166, 165, 164, 163, 162 සහ 146 තුළ පී. පී. ත්‍රී. 30. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය .-* අවුරුදු තිහයි (30), (2013.05.27 දින සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2013 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුලු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

*වාර මුදල.-* වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

*(ආ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙන කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය ;

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඊ)* 2013.05.27 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2013 ජූලි මස 26 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 1200/6,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-567

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.